**ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6.3(අ) ඡේදය | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල SA-82 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාවෙහි රු.මිලියන 74.77 ක් වටිනා ප්‍රවාහන උපකරණ තුල ඇතුළත් කර තිබූ රු.මිලියන 10.70 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 04 විධිමත් පරිදි පවරාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කල යුතු බව. | 1.6.1(ආ) ඡේදය |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය තුලදී ගමන් වියදම් වෙනුවෙන් රු.මිලියන 8 ක් සහ වෙනත් සේවා වෙනුවෙන් රු.750,000 ක් වශයෙන් එකතුව රු.මිලියන 8.76 ක් මු.රෙ.66 මගින් මාරුකිරීම් පිළිබද, 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 6 වන උප වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර තිබූ මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාවය දැක්වෙන ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයන්හිදී අවසාන ගිණුම් සකස් කිරීමේදී ඒසීඒ 2(iii) ආකෘතිය නිවැරදිව සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුවීම. |

(ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාවෙහි ඇතුළත් කර තිබූ රු.මිලියන 73 ක් වටිනා ප්‍රවාහන උපකරණ තුල රු.මිලියන 10.70 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 04 ක්ද ඇතුලත්ව තිබුණි. | මෙම වාහන 04 හි අයිතිය සතු ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය හා ලූනාව පාරිසරික ප්‍රවර්ධන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය මේ වන විට නිමාවට පත්කර ඇති අතර අයිතිය පවරා ගැනීම සඳහා අවශ්‍ය ලේඛණ ලබා දෙන ලෙස ඉල්ලා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ලිපි ඉදිරිපත් කර ඇත. | භාවිතා කරනු ලබන වෙනත් ආයතනවලට අයත් වත්කම් විධිමත් පරිදි පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 පිළිබඳ අවදානය යොමු නොකර ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයන් 18 ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් සියයට 12 සිට සියයට 95 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | 2023 වර්ෂය තුල රජය විසින් නිකුත් කල වියදම් කළමනාකරණ චක්‍රලේඛවලට අනුව වියදම් දැරීම සීමා කිරීම, සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කල පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බාහිර සම්පත් දායකයින් ලබා ගැනීමේදී ඇති වූ ප්‍රමාදය නිසා මූල්‍ය ප්‍රගතිය අඩු වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන අවශ්‍යතාව නිශ්චිතව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුය. |
| (ආ) | එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික හදිසි ළමා අරමුදල (UNICEF) මගින් රටෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලැබී තිබූ විදේශ ප්‍රදාන යටතේ වූ සියයට 66 ක් එනම් රු.මිලියන 6.6 ක් අදාල කාර්යයන් සඳහා උපයෝජනය නොකර ඉතිරිව පැවතුනි. මෙම අරමුදල මගින් ලැබෙන ප්‍රතිපාදනවලින් | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බාහිර සම්පත් දායකයින් ලබා ගැනීමේදී ඇති වූ ප්‍රමාදය නිසා මූල්‍ය ප්‍රගතිය අඩු වී ඇත. එමෙන්ම මෙම වැඩසටහනට අදාල ව්‍යාපෘති බාහිර ආයතන මඟින් සිදු කර ගැනීමේදී ව්‍යාපෘතිය අවසන් කර ගැනිමේ ප්‍රමාදයන් ඇතිවීම හා 2023 වර්ෂයේ ගෙවීම් කිරීමට බිල්පත් ඉදිපත් කිරීමේ ප්‍රමාදයන් ඇති විය. | විදේශ ප්‍රදාන ලෙස ලැබෙන මෙම මුදල් අදාළ අරමුණු වෙනුවෙන් වැය කිරීමට කළමණාකරනයේ නිසි අවදානය යොමු විය යුතුය. |

| | | |
|---|---|---|
| සැලකිය යුතු ප්‍රතිපාදනයක් වාර්ෂිකව ඉතිරි වී තිබුණ අතර පෙර වර්ෂයේ ඉතිරි වූ ප්‍රතිපාදනය රු.මිලියන 2.32 ක් වී තිබුණි. | | |

**2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ග්‍රාමීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂය තුලදී ලබා දි තිබූ එකතුව රු.මිලියන 389 ක් වූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 217 ක් එනම් සියයට 56 ක් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. එමෙන්ම ඒ පිළිබඳ තොරතුරු විසර්ජන ලෙජරයේ සටහන් කර නොතිබුණි. | මෙම ඉදිකිරීම් භූමියේ සිදු වූ නායයෑම් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් නිර්දේශ ලැබෙන තෙක් ව්‍යාපෘති ප්‍රමාද වීම හා ඒ වෙනුවට පසුව අනුමත කල නව ව්‍යාපෘතිවලද ප්‍රසම්පාදන කටයුතු සිදුකල පසු ඇස්තමේන්තු මුදලට වඩා ප්‍රතිපාදන ඉතිරිවීම. | ග්‍රාමීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදෙන ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කිරීමට කළමණාකරණය වගකීමෙන් යුතුව කටයුතු කල යුතුය. |

**2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.7 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දි නොතිබුණි. | විගණන විමසුම්වලට අදාල කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම් සිදුකර පිළිතුරු සැපයිය යුතු බැවින් විගණනයෙන් සඳහන් කරනු ලබන දිනට පෙර පිළිතුරු ඉදිරිපත් කිරිම ප්‍රමාදව පවතියි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන්, තාවකාලිකව ජල සම්පාදන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරගෙන යන අතර අභ්‍යන්තර විගණක තනතුර සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ තනතුරක් ලෙස ඇති කිරීමට යෝජනා කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු විධිමත් කිරීමට කටයුතු කළ යුතුයි. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 565(3) | දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු ලෙජරයෙහි උක්ත මුදල් රෙගුලාසිය ප්‍රකාරව මාසිකව ලැබීම්, ගෙවීම් සටහන් කර ශේෂ සාරාංශ සකස් කර අවශ්‍ය නිවැරදි කිරීම් හා ගැලපීම් සිදුකර යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | සෑම මාසයක් අවසානයේම තුලන ගිණුම පොදු තැම්පත් ගිණුමේ සටහන් කිරීමට 2024 වර්ෂයේ සිට කටයුතු කරනු ලබයි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.5 අවිධිමත් ගනුදෙනු

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය හා 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් ප්‍රජා පාදක සංවිධාන වෙත ජල සම්පාදන ව්‍යාපෘති ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පැවරිය හැකි වේ. එසේ වුවද ඇස්තමේන්තු වටිනාකම එකතුව | 2019 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අදියර වශයෙන් සියයට 20 ප්‍රජා දායකත්වය සමඟ ප්‍රජා මූල සංවිධාන වෙත කොන්ත්‍රාත් පිරිනමා තිබුණද 2021 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අදාල ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන ප්‍රජා මූල සංවිධානයට පමණක් කොන්ත්‍රාත් පිරිනමා ඇත. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ව්‍යාපෘති අසාර්ථක වීමට සෘජු ලෙස බලපා ඇති බැවින් ඊට වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුයි. |

| | | |
|---|---|---|
| රු.මිලියන 48 ක් වූ මාතලේ දිස්ත්‍රික්කයේ ජල ව්‍යාපෘති 05 ක ඉදිකිරීම් කටයුතු දිස්ත්‍රික් ස්ථානභාර නිලධාරීගේ නිර්දේශ මත ප්‍රජා මූල සංවිධාන වෙත ප්‍රදානය කර තිබුණි. මෙම ජල ව්‍යාපෘති 05 මගින් පවුල් 970 කට ජලය ලබාදීමට අපේක්ෂාකර තිබුණද සත්‍ය ලෙස ජල සැපයුම ලබා දී තිබුණේ පවුල් 377 කට පමණක් වන අතර එම ජලයද පිරිසිදු පානීය ජලය බවට තහවුරු වන වාර්තා නොතිබුණි. ව්‍යාපෘති දෙකක ඉදිකල නල ළිං මගින් ප්‍රමාණවත් ජල සැපයුමක් ලැබී නොතිබීමෙන් වෙනත් ජල මූලාශ්‍ර යොදාගැනීමටද සිදුව තිබුණි. | ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදී එම ප්‍රදේශයේ ජල අවශ්‍යතා පවතින පවුල් සංඛ්‍යාව පදනම් කරගනිමින් අදාල ව්‍යාපෘතිය ආරම්භ කලද ව්‍යාපෘතිය නිම වූ පසු සියළුම සාමාජිකයන් එකවර ජල සම්බන්ධතා ලබා ගැනීම ප්‍රායෝගිකව සිදුනොවේ.<br><br>භූගත ජලය මත පදනම් වූ නල ලිංවල විශේෂයෙන් නියං කාලවලදී ජලය සිදී යාම සිදුවේ. | |

## 2.6 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් ආයතනවලින් දෙපාර්තමේන්තුව වෙත ලැබී තැන්පත් ගිණුමේ රඳවාගත් මුදලින් 2023 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 2 කට වඩා වැඩි ශේෂය රු.මිලියන 30 ක් වූ අතර වැඩ අවසන් වූ ව්‍යාපෘති හඳුනාගෙන එම ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වැඩ අවසන් කල සියළුම ව්‍යාපෘතිවල ඉතිරි මුදල් මුදල් රෙගුලාසි ප්‍රකාරව 2024 ජුනි 30 දිනට පෙර අදාල ආයතන වෙත යොමු කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී වර්ෂ 9½ ක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පනත සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එබැවින් දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට අදාල කැබිනට් පත්‍රිකාවේ සඳහන් කාර්යයන් සිදුකිරීමට දෙපාර්තමේන්තුවට නෛතික පසුබිමක් නොතිබුණි. | නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් අවසන් කෙටුම්පත සකස් කර ඇති අතර ඒ සඳහා නිරීක්ෂණ මේ වන විට කඩිනමින් යොමු කිරීමට කටයුතු කෙරේ. | පනත සම්මත කර ගැනීම කඩිනම් කර දෙපාර්තමේන්තුවේ කාර්යයන් විධිමත්ව පවත්වා ගැනීමට අවශ්‍ය නෛතික පසුබිම සකසාගත යුතු වේ. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය තුල ඉදිකිරීම් ආරම්භ කරන ලද රත්නපුර දිස්ත්‍රික්කයේ මාදම්පේ දකුණු ප්‍රජා ජල ව්‍යාපෘතියේ රු.531,137 ක් වැය කර පොම්පාගාරය සඳහා පැති බැම්මක් ඉදිකලද පොම්පාගාරය ඉදි නොකිරීමෙන් ඒ සඳහා වැය කල මුදල නිශ්කාර්ය වී තිබුණි. | මාදම්පේ දකුණ ගොඩකවෙල පොම්පාගාරය ඉදිකිරීමට යෝජිත ස්ථානය නාය යාමට ඉඩ ඇති බැවින් ඒ සඳහා පැති බැම්මක් ඉදිකර ඇත. | ව්‍යාපෘතිය කඩිනමින් නිමකර ප්‍රතිලාභී පවුල්වලට ජලය සැපයීම සිදු කල යුතුයි. |
| (ආ) | රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ, පැල්මඩුල්ල, අයගම හා මාදම්පේ යන ප්‍රදේශවල ඉදිකර තිබූ ජල ව්‍යාපෘති 05 ක ඉටු නොකල වැඩ වෙනුවෙන් රු.මිලියන 1.4 ක් වැඩිපුර ගෙවීම්කර රජයේ මුදල් අවභාවිතා කර තිබුණි. | බලන්ගොඩ විකිලියවත්ත ප්‍රජා මූල ජල යෝජනා ක්‍රමයෙහි වහලයේ පැවති අධික උස හේතුවෙන් මිනුම් කටයුතු නිවැරදිව සිදුකර ගැනීමට අපහසු වූ අතර පසුව මිනුම් නිවැරදිව සිදු කර අවසන් බිලපත් මගින් ගෙවීම් සිදු කර ඇත. | ඉටුනොකල වැඩ සඳහා ගෙවීම් සහතික කිරීමට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට අදාළ 2014 මාර්තු 13 දිනැති අංක 17/2014 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අංක 614 : 2013 දරන "පානීය ජලය සඳහා පිරිවිතර" ප්‍රකාරව ජල තත්ත්ව පරීක්ෂණයන් සිදුකළ යුතු වුවද භෞතික විගණන පරීක්ෂාවන්ට අනුව 2019 වර්ෂයේ ආරම්භ කර ඉදිකිරීම් අවසන් කරන ලද ජලය ලබාදෙන ව්‍යාපෘති 92 න් ව්‍යාපෘති 12 ක ජල තත්ත්ව පරීක්ෂාවන් සිදු කර නොතිබුණු අතර 2023 සැප්තැම්බර් වන විට ව්‍යාපෘති 05 ක අවසන් වරට ජල පරීක්ෂණය සිදු කර තිබුණේ වර්ෂ 04 කට පෙරය. එමෙන්ම ව්‍යාපෘති 08 ක වර්ෂයකට පෙරද, ව්‍යාපෘති 06 ක වර්ෂ 02 කට පෙරද, ව්‍යාපෘති 08 ක වර්ෂ 03 කට පෙරද ජල තත්ත්ව පරීක්ෂාවන් සිදුකර තිබූ අතර ව්‍යාපෘති 28 ක පමණක් ජල තත්ත්ව පරීක්ෂාව 2023 වර්ෂයේදී සිදු කර තිබුණි. | දෙපාර්තමේන්තුව මගින් ජලයේ ගුණාත්මක තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා වාර්ෂිකව නොමිලේ ජල සාම්පල් 02 ක් පරීක්ෂා කිරීම, නවීන අංගෝපාංග ඇතුළත් කුඩා පරිමාණයේ රසායනාගාර 17 ක් ස්ථාපිත කර සහනදායී ක්‍රමයට ජල සාම්පල පරීක්ෂා කිරීමට පහසුකම් සපයා තිබීම, සංවර්ධන නිලධාරීන් මගින් සියළු ප්‍රජා මූල සංවිධාන මේ වන විට දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් සිදුකර ඇති අතර විශේෂ මාර්ගෝපදේශ මාලාවක් මේ වන විට නිකුත් කර ඇත. | ජනතාවට පිරිසිදු පානීය ජලය සැපයීම දෙපාර්තමේන්තුවෙහි මූලික කාර්යභාරය බැවින් ඒ සඳහා හඳුන්වා දී ඇති ක්‍රමවේද මනා අධීක්ෂණයකින් යුතුව පවත්වාගෙන යා යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ලෝක බැංකු ආධාර යටතේ ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් රු.මිලියන 50 ක් වටිනා කුඩා පරිමාණයේ ජල පරීක්ෂණාගාර (Mini Labs) 17 ක් දෙපාර්තමේන්තුව වෙත ලබා දී දිස්ත්‍රික්ක 10 ක ස්ථානගතකර තිබුණද රසායන ද්‍රව්‍ය නොමැතිවීම, බැටරි නොමැතිවීම වැනි කාරණා හේතුවෙන් ඉන් පරීක්ෂණාගාර 7 ක් ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවති අතර ඉන් ජල පරීක්ෂණාගාර 2 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත හා බදුල්ල ප්‍රාදේශීය සභාව වෙතද පවරා තිබුණි. | ලෝක බැංකු ආධාර යටතේ ලබා දී ඇති ජල පරීක්ෂණාගාර 17 අතුරින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත්තේ ජල පරීක්ෂණාගාර 11 ක් පමණි. එම ජල පරීක්ෂණාගාර අතරින් රත්නපුර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වලට ලබා දී ඇති ජල පරීක්ෂණාගාර ක්‍රියාත්මක තත්වයේ පවතී.<br><br>කෑගල්ල දිස්ත්‍රික්කයට ලබා දුන් ජල පරීක්ෂණාගාර දෙක අතරින් උඩුගොඩ ජල පරීක්ෂණාගාරය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා ඇති අතර කොටියාකුඹුර ජල පරීක්ෂණාගාරය පමණක් අක්‍රියව පවති. බදුල්ල හා කුරුණෑගල කුඹුක්ගැටේ නිල්දියවර ප්‍රජා මූල සංවිධානය වෙත ලබා දෙන ලද ජල පරීක්ෂණාගාර ක්‍රියාත්මක වෙමින් පවතී. | මෙම උපකරණවල අඩුපාඩු හඳුනාගෙන අවශ්‍ය අලුත්වැඩියාවන් කර පිරිසිදු පානීය ජලය ලබා දීමට අවශ්‍ය කටයුතු කල යුතුය. |
| (ඉ) | පුත්තලම හා කෑගල්ල දිස්ත්‍රික්කවල එකතුව රු.මිලියන 26.6 ක් වැයකර ඉදිකළ ව්‍යාපෘති 03 කින් එක් ව්‍යාපෘතියක නළ ළිඳේ වැලි පිරීම හේතුවෙන් සහ ව්‍යාපෘති 02 ක ආරම්භයේදී හඳුනාගත් ජල මූලාශ්‍රය නියං සමයේදී සිඳී යාමට භාජනය වන බැවින් විකල්ප ක්‍රම උපයෝගී කරගෙන ජලය බෙදා හැරීමට කටයුතු කර තිබුණු අතර එම විකල්ප මූලාශ්‍ර තෝරාගැනීමේදී ජලය පිරිසිදු පානීය ජලය බවට තහවුරු කිරීමක් සිදු වී නොතිබුණි. විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ ජල තත්ත්ව වාර්තා අනුව භාවිතයට නුසුදුසු බවට තහවුරු වී තිබූ වෙනත් ජල ව්‍යාපෘති 11 ක් මගින් ප්‍රතිලාභී පවුල් 1,518 ක් සඳහා පානීය ජලය සපයමින් තිබුණි. | නියං සමයේදී බොහෝ කුඩා පරිමාණ ජල ව්‍යාපෘතිවල නිරන්තරයෙන් මෙවැනි තත්ත්වයන් ඇතිවීම ස්වභාවික වේ. මෙවැනි හඳුනාගත් ගැටළු සම්බන්ධව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ජල සම්පත් මණ්ඩලය සමඟ ඒකාබද්ධව වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.<br><br>කුරුණෑගල, හම්බන්තොට, පුත්තලම හා අනුරාධපුර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 7 න් ලබාදෙන ජලයේ ගුණාත්මක බව මද බැවින් ජලය උණුකර පානය කිරීමටත්, | මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් රජයට පාඩු සිදුවීම මෙන්ම එම කටයුත්ත නිසි ප්‍රමිතියකින් සිදුනොකිරීමෙන් ප්‍රතිලාභ අපේක්ෂිත ජනතාවගේ අවශ්‍යතාව ඉටුනොවීම පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වගකිවයුතු නිලධාරීන්ට අදාලව විනය ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | |
|---|---|---|
| | ක්ලෝරීන්කරණය කිරීමටත්, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල ව්‍යාපෘතිවල ජලයේ ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කර ඇත.<br><br>ඊට අමතරව UNICEF ප්‍රතිපාදන මත ක්ලෝරීන් 6325 kg ක් ප්‍රජා මූල සංවිධානවලට ලබාදී ඇත. | |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පවුල් 220 ක් සඳහා පිරිසිදු පානිය ජලය ලබා දිම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 7 කට ආරම්භ කර තිබූ මාතලේ දිස්ත්‍රික්කයේ ඕපල්ගල මෙත්සිත් ජල ව්‍යාපෘතියේ ඉදිකිරිම් කටයුතු 2019 වර්ෂයේදි ප්‍රජා ජල මූල සංවිධාන 04 ක් වෙත ලබාදී ව්‍යාපෘතියේ ඉදිකිරිම් කටයුතු සඳහා රු.මිලියන 7 ක් වැය කලද පවුල් ඒකක 05 ක් සඳහා පමණක් ජලය සැපයීම සිදුකර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2020 ඔක්තෝබර් 6 දින ජනතා අයිතියට පත්කර තිබුණු අතර ආරම්භයේ සිටම පිරිසිදු පානීය ජලය ලබා දුන් බව තහවුරු නොවුණි. මෙමගින් ලබාගත් ජල සාම්පල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පරික්ෂණාගාර මගින් පරික්ෂා කිරිමේදි භාවිතයට නුසුදුසු බව වාර්තාකර තිබුණි. විගණන භෞතික පරික්ෂාවට අනුව මෙම ව්‍යාපෘතියේ ඉටු නොකල ඉදිකිරිම් හා සවිකිරිම් වෙනුවෙන් රු.මිලියන 1.2 ක් කල වැඩ පිළිබඳ පරික්ෂාවකින් තොරව ගෙවීම් කර රජයට පාඩු සිදු කර තිබුණි. | මේ සම්බන්ධයෙන් ත්‍රිපුද්ගල කමිටුවක් විසින් අදාල කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර විමර්ශන වාර්තාව 2024 මැයි 10 දින ඔබ වෙත එවා ඇත. | විගණන නිරීක්ෂණවල ඇතුලත් කරුණු පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කර අදාල පාඩු සඳහා වග කිව යුතු නිළධාරින්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රජා ජල අභිමානි වැඩසටහන යටතේ 2019 වර්ෂයේදී මාතලේ දිස්ත්‍රික්කයේ එකතුව රු.මිලියන 41 ක් වැය කර ආරම්භ කර තිබූ ප්‍රජා ජල ව්‍යාපෘති 04 කින් දෙකක ඉදි කර තිබූ නල ළිං මගින් ප්‍රමාණවත් ජල සැපයුමක් නොලැබීම මත වෙනත් ජල මූලාශ්‍ර යොදාගැනීමට සිදු වී තිබූ අතර ඒ වෙනුවෙන් වැය වූ රු.මිලියන 2 ක මුදල නිශ්කාර්ය වී තිබුණි. | ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදී එම ප්‍රදේශයේ ජල අවශ්‍යතා පවතින පවුල් සංඛ්‍යාව පදනම් කරගනිමින් අදාල ව්‍යාපෘතිය ආරම්භ කලද, ව්‍යාපෘතිය නිම වූ පසු සියළුම සාමාජිකයන් එකවර ජල සම්බන්ධතා ලබා ගැනීම ප්‍රායෝගිකව සිදුනොවේ. | විගණන නිරීක්ෂණවල ඇතුලත් කරුණු පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කර අදාල පාඩු සඳහා වග කිව යුතු නිළධාරින්ට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියා මාර්ග ගත යුතුය. |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය තුලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුළු ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 78 ක් වූ ප්‍රජා ජල ව්‍යාපෘති 09 ක් ඉදි කිරිම සඳහා පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුම්වලට එළඹ තිබුණි. මෙම කොන්ත්‍රාත්කරුගේ තාක්ෂණික හැකියාව, යන්ත්‍ර උපකරණ ප්‍රමාණවත් බව හා පෙර පලපුරුද්ද පිලිබඳ නොසලකා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. ඒ අනුව 2024 පෙබරවාරි මස වන විට ලබා දී තිබූ කොන්ත්‍රාත් 9 න් ඇස්තමේන්තු වටිනාකම එකතුව රු.මිලියන 51 ක් වූ කොන්ත්‍රාත් 6 ක ඉදිකිරීම් අත්හැර දමා අන්‍යෝන්‍ය එකඟතාවය මත කොන්ත්‍රාත් අවසන් කිරිමට කටයුතු කර තිබූ අතර එම කොන්ත්‍රාත් වෙනුවෙන් වැයකර තිබූ එකතුව රු.මිලියන 38 ක මුදල අනාර්ථික ගණුදෙනුවක් වී තිබුණි. | රට තුල මතුවූ ආර්ථික අර්බුදය තුල ඉදිකිරීම් ද්‍රව්‍ය මිල අධික ලෙස ඉහල යාම තුල ගිවිසුම්ගත කාර්යන් අදාල කොන්ත්‍රාත් සමාගම් විසින් ඉටු නොකල බැවින් කොන්ත්‍රාත්කරු සමඟ අන්‍යෝන්‍ය එකඟතාවය මත ගිවිසුම අවලංගු කිරිමට කටයුතු කරමින් පවතියි. | ප්‍රසම්පාදන කටයුත්තේදී සිදු වී ඇති අවිධිමත්භාවය පිලිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර ඒ තුළින් රජයට යම් පාඩුවක් තිබේ නම් ඊට වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ආ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ සඳ දිය ප්‍රජාමූල සංවිධානයේ සහ රඹෑව පානීය ජල ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 15 ක් වැයකර ඉදිකරන ලද ජල ටැංකි 3 ක ඉදිකිරීම් අවසන් කර 2024 මාර්තු වන විට මාස 03 සිට මාස 15 ක කාලයක් ගත වී තිබුණද, ව්‍යාපෘතිය නිමකර අදාල ජල | සඳ දිය ප්‍රජා මූල සංවිධානය හා රඹෑව පානීය ජල ව්‍යාපෘතිය සඳහා මුදල් ප්‍රතිපාදන ලැබෙන ප්‍රමාණය අනුව අදියර වශයෙන් ඉදිකිරීම් කටයුතු නිම කිරිමට නියමිතය. | පවතින ප්‍රතිපාදන අනුව ව්‍යාපෘති ආරම්භ කල යුතු අතර ආරම්භ කර ඇති ව්‍යාපෘති කඩිනමින් නිමකර ජනතාව වෙත ජලය ලබාදීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සබඳතාව ලබාදීමට කටයුතු නොකිරීම මත මෙම ටැංකි භාවිතයට නොගෙන නිශ්කාර්ය තත්ත්වයට පත් වී තිබුණි. | | |
| (ඇ) | කුරුණෑගල දිස්ත්‍රික්කය තුල 2019, 2020 හා 2021 යන වර්ෂවලදි ආරම්භ කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති 19 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ප්‍රතිලාභි ජනතාවට පානිය ජලය සැපයිමට නොහැකි වි තිබූ අතර 2023 දෙසැම්බර් 31 වන විට එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 14 ක් සඳහා රු.මිලියන 106 ක් වැයකර තිබුණි. එමෙන්ම පුත්තලම, ත්‍රිකුණාමලය, මාතලේ, මඩකලපුව සහ ගාල්ල යන දිස්ත්‍රික්කවල 2021 වර්ෂය තුලදී ඉදිකිරිම් ආරම්භ කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති 11 ක ඉදිකිරිම් කටයුතු අතර මඟ නවතා දමා තිබූ අතර ඒ වන විට එම ව්‍යාපෘති වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් දරන ලද රු.මිලියන 18.6 ක මුදලද නිශ්කාර්ය වී තිබුණි. | වැඩ අවසන් නොවූ ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන ලැබෙන ප්‍රමාණය අනුව අදියර වශයෙන් ඉදිකිරිම් කටයුතු නිම කිරිමට නියමිතය. | -එම - |
| (ඈ) | අනුරාධපුර දිස්ත්‍රික්කය තුල 2021 හා 2022 වර්ෂය තුල ප්‍රජා ජල ව්‍යාපෘති 08 ක් සඳහා නැනෝ පිරිපහදු යන්ත්‍ර රු.මිලියන 19 ක් වැය කරමින් ස්ථාපිත කිරිමට සැලසුම් කර තිබුණි. එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 03 කට අදාල පිරිපහදු මධ්‍යස්ථාන ගොඩනැගිලි වසර 02 කට වැඩි කාලයක සිට ඉදිකිරිම් වැඩ අවසන් කිරීමෙන් තොරව අතරමග නවතා දමා තිබුණි. ඒ අනුව ඒ සඳහා දෙපාර්තමේන්තුව වැය කරන ලද එකතුව රු.මිලියන 6.6 ක සම්පූර්ණ පිරිවැයම නිශ්කාර්ය වී තිබුණි. | අනුරාධපුර දිස්ත්‍රික්කය තුල 2021 හා 2022 වර්ෂ තුල ව්‍යාපෘති 08 ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ අතර එයින් 03 ක ඉදිකිරිම් කටයුතු ආරම්භ කර ඇත. එම ඉදිකිරිම් කටයුතු කඩිනමින් අවසන් කරන ලෙස අදාල ඉදිකිරිම් සමාගමට දැනුම් දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝදේශ සංග්‍රහයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, කොන්ත්‍රාත්කරුවන් තෝරා ගත යුතු වන අතර කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය හා කාර්ය ශක්‍යතාවය පිළිබඳ අවධානය යොමු නොකර කොන්ත්‍රාත් ප්‍රදානය කල නිළධාරීන්ට විරුද්ධව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

## 3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 56 ක්වූ මාතර, වැලිගම පෝරඹ කනංකේ (දකුණ) ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘතිය 2019 නොවැම්බර් 08 දින ආරම්භකර ඉදිකිරීම් කටයුතු කොටස් 08 කට වෙන්කර ප්‍රජා මූල සංවිධානය වෙත පවරා තිබුණි. ව්‍යාපෘතියේ වැඩ විෂයයන් 02 ක් නියමිත දිනට පෙර අවසන් නොකිරීමෙන් වෙළෙඳපොළ මිලගණන් ඉහලයාම නිසා මුල් ඇස්තමේන්තුවට වඩා රු.මිලියන 7 ක් වැඩි නව ඇස්තමේන්තු සකස් කිරිමට සිදුව තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 27 ක් වැය කර තිබුණු අතර වර්ෂ 4 ක් ඉක්ම ගොස් තිබුණද ව්‍යාපෘතිය නිම නොවී පැවති අතර ඒ වෙනුවෙන් වැයකර තිබූ මුදල නිශ්කාර්ය වැයක් බවට පත්වෙමින් පැවතුණි. | මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදු කරන ලෙස ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාශය වෙතින් ඉල්ලීම් කර ඇත. | ව්‍යාපෘති ඉදිකිරීම් කාර්යයන් කඩිනම් කල යුතු අතර ප්‍රමාද වීම මත දැරීමට සිදුවන අමතර පිරිවැය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 3.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව එහි ප්‍රධාන කාර්යයන් ලෙස හඳුනාගෙන තිබූ ප්‍රජා මූල සංවිධාන සඳහා ව්‍යවස්ථා හා ගිවිසුම් සම්පාදනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් සකස්කර නොතිබුණි. | සෑම ප්‍රජා මූල සංවිධානයක් සඳහාම ව්‍යවස්ථාවක් සකස් කර ඇති අතර එම ව්‍යවස්ථා අනුව කටයුතු කිරීම දිස්ත්‍රික් කාර්යාල මගින් අධීක්ෂණය කරයි. | දෙපාර්තමේන්තුව විසින් සකස්කරනු ලබන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අවශ්‍ය කාර්ය සාධන මට්ටම ලඟා කර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කෙටුම්පත් කාර්ය සාධන වාර්තාවේ අනුකූලතා වාර්තාව මගින් අනුකූල වන ලෙස දක්වා තිබූ නමුත් අනුකූල නොවන අවස්ථා 19 ක් වූ අතර දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත අනුමත ව්‍යාපෘති 482 ක් ලෙස වාර්තාවේ 2.1 මගින්ද 2.1.2 මගින් එම ප්‍රමාණය 382 ක් ලෙසද දක්වා තිබුණි. ඒ අනුව විගණනය වෙත ඉදිරිපත් කර තිබූ කාර්ය සාධන වාර්තාවේ ඇතුළත් ඇතැම් කරුණු සාවද්‍ය බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | ඔබ වෙත යොමුකරන ලද කෙටුම්පත් වාර්තාවට අනුව අනුකූල වන අවස්ථා ලෙස සටහන් කර තිබූ අනුකූල නොවන අවස්ථා නැවත පරීක්ෂා කර නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. | කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීමේදී නිවැරදි තොරතුරු ඇතුලත් කල යුතු වේ. |

## 3.7 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 04 දින නිකුත් කරන ලද විගණන විමසුමක් සඳහා 2024 අප්‍රේල් 30 වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි. | හැකි ඉක්මනින් පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. | විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබාදීම කළමණාකාරිත්වයේ වගකීම වේ. |

## 4. යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරණ විගණන හා කළමණාකරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 03 ඡේදය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳ ප්‍රමාණවත් අභ්‍යන්තර පරීක්ෂාවක් සිදු වී නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන්, තාවකාලිකව ජල සම්පාදන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරගෙන යනු ලබයි. | සුදුසු අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර අභ්‍යන්තර විගණන ඒ්කකයක් පිහිටුවා පරීක්ෂණ කටයුතු සිදුකිරීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 36 න් තනතුරු 18 ක් ඇතුලුව සියළුම කාණ්ඩවල පුරප්පාඩු සංඛ්‍යාව සියයට 14 ක පමණ ප්‍රතිශතයක් විය. කෙසේ වුවද සේවකයින් 72 ක අතිරික්තයක්ද, අනුමත තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 09 ක් ද නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවෙහි පවතින පුරප්පාඩු පිරවීම සඳහා ලිපි මඟින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එහෙත්, රාජ්‍ය සේවයට නව බඳවා ගැනීම් සීමා කිරීමත් සමඟ නිලධාරීන් අනුයුක්ත කිරීම සිදු නොවුණි. ඉතා අත්‍යවශ්‍ය රාජකාරි ඉටු කිරීමට අනුමැතිය ලබා ගෙන නිලධාරීන් කොන්ත්‍රාත් පදනමින් එම බඳවා ගැනීම් සිදු කර ඇත.<br>එමෙන්ම, අතිරික්ත සංවර්ධන නිලධාරි තනතුරු සඳහා නව තනතුරු 50 ක් ඇති කරන ලෙස කළමනාරකණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර දැනට අනුමත වී ඇති රසඥ හා භූ ගර්භ විද්‍යාඥ තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. | දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය වන කාර්යමණ්ඩලය පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |